

"නුමුත් වරක් දුර සිටියා වූ නුඹලා දැන් ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ උන්වහන්සේ ගේ ලේ කරණකොට ගෙන ළංකරනු ලැබුවහුය''

එපීස 2:13

# ස්වර්ගයට යෑමට

**ස්වර්ගයට යෑමට නම්, ඔබ දැනගත යුතු වැදගත් දෙය වන්නේ:**
''මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති.'' සහ ''මක්නිසාද පාපයේ කුලී නම් මරණයය, නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම් අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය.''
රෝම 3:26, 6:23

**ස්වර්ගයට යෑමට යේසුස්වහන්සේ පැවසූ දේ දැනගැනීමට ඔබව දිරිගැන්වීමක් :**
''මම නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිණිස යමි. මා සිටින තැන නුඹලාත් සිටින පිණිස මම නැවත ඇවිත් නුඹලා මා ළඟට ගන්නෙමි.''
යොහන් 14:2

**ස්වර්ගයට යෑමට ඒ යේසුස්වහන්සේව දැන ගැනීමට අපූරු දෙයක්:**
''ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්'' සහ ''එසේ කළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයාව මරණය කරණකොටගෙන බල නැතිකොට'' එතුමා ''මම ජීවමාන වූ තැනැත්තාය; මම මැරුණෙමි, නුමුත් බලව, මම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි, මරණයේද, පාතාලයේද යතුරු මට ඇත්තේයයි ස්වාමින්වහන්සේ ප්‍රකාශ කරන සේක.''
1 කොරින්ති 15:3 , හෙබ්‍රෙව් 2:14, එළිදරව්ව 1:18

**ස්වර්ගයට යෑමට නම් ගැළවීම යනු දෙවියන්වහන්සේ විසින් පසුතැවිලිවෙන්නන්ට නොමිලේ ලබා දෙන තෑග්ගක් බව ඔබ දැනගන්න අවශ්‍යයි :**
''මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව, දෙවියන්වහන්සේගේ දීමනාවය.''
එසේම ස්වාමී වු යේසුස්ක්‍රිස්තුස්වහන්සේ පවසන සේක්,
''දොරකඩ නම් මමය. යමෙක් මා කරණකොට ගෙන ඇතුල්වේද ඔහු ආරක්ෂාකරනු ලැබ ඇතුලට සහ පිටතට ගොස් ගොදුරු ලබන්නේය.''
එපීස 2:8, යොහන් 10:9

# බලාපොරොත්තුවක් නැත්තාට බලාපොරොත්තුවක්



ඔබට

# ඒඩ්ස්

**තිබුණද, නැතිවූවද,**

## ස්වර්ගයට යෑමට මාර්ගයක්

**දෙවියන්වහන්සේ ඔබ වෙනුවෙන් නිර්මාණය කර තිබෙනවා.**

# එලෙසම දෙවියන්වහන්සේ වසින් ඔබට සාතන්ව අභිබවා යා හැක්කේ කෙසේද කියා ප්‍රකාශ කරනවා.

| | |
|---|---|
| "ඔවුන් ඔහුගෙන් ජයගත්තා... | මින් අදහස් වන්නේ, ඔබට සාතන්ව නැතිනම් යක්ෂයාව පරාජය කල හැකි බවයි. ඔබගේ පාපය හා අසාර්ථකත්වය පිළිබඳ ඔබට චෝදනා කරන්නේ දෙවියන්වහන්සේගේ සතුරාවන යක්ෂයායි. අඩුම තරමේ ඔබට ස්වර්ගය ගැන බලාපොරොත්තුවක්වත් නැතැයි කියා සිතන්න සැලැස්වීම සාතන්ගේ වුවමනාවයි. |
| බැටළුපැටවාණන් ගේ ලේ නිසාද... | මින් අදහස් කරන්නේ සෑම කෙනෙකුගේම රුධිරයේ මරණයේ බීජය අඩංගු වුවත් ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරය පමණක් පවිත්‍ර කරනු ලැබූ බවයි. උන්වහන්සේගේ නිර්මල රුධිරය වැගිරුණේ ඔබේ පාපය උදෙසායි. ඔබ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබේ විශ්වාසය තබනවා නම් ඔබට චෝදනා කිරීමට සාතන්ට කිසිසේත්ම හැකියාවක් නැහැ. මක්නිසාද යේසුස්වහන්සේගේ රුධිරයෙන් ඔබව සාතන්ගේ ග්‍රහණයෙන් මේ වන විටත් නිදහස් කර හමාර නිසාය. |
| තමුන්ගේ සාක්ෂියේ වචනය නිසා... | ඔබගේ පෞද්ගලික ස්වාමින් හා ගැළවුම්කරුවාණන් ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පත් කරගැනිමට ඔබ තීරණය කර තිබේය කියා ඔබ අන් අයටත් අනිවාර්යෙන්ම කියා සිටිය යුතුය යන්න මින් අදහස්වේ. |
| ඔවුහු මරණය විදින තරමට පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය." එළිදරව්ව 12:11 | මින් අදහස් වන්නේ, ස්වාමින්වන යේසුස්වහන්සේ ඔබ උදෙසා මැරුණු නිසා දැන් උන්වහන්සේ කෙරෙහි ඇති ඔබේ ප්‍රේමය ඔබේ ජීවිතයටත් වඩා විශාල බවයි. ඔබේම වචනයෙන් ඔබ උන්වහන්සේට කෙතරම් ප්‍රේම කරනවාදැයි පවසන්න. |

විවාහයේ සම්බන්ධතාව දෙවියන්වහන්සේ විසින් එක් පිරිමියෙක්ට එක් කාන්තාවක ලෙස සැලසුම් කළ සේක.

"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළ සේක.එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙන ම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිස ය."
(යොහාන් 3 :16)

දෙවියන්වහන්සේගේ ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීමට සහ ඔබට සදාකාල ජීවනය ඇති බවට සහතිකවීමට නම් ඔබ මුළු හදවතින්ම උන්වහන්සේට යාච්ඤා කරන්න අවශ්‍යයි. ඔබගේ සදාකාලික ඉරණම රඳා පවතින්නේ ඔබ දෙවියන්වහන්සේගේ ප්‍රේමයට දක්වන ප්‍රතිචාරය සහ ඔබ කරන හෘදයාංගම යාච්ඤාව මතයි.
මේ මොහොතේම ඔබ මෙවැනි යාච්ඤාවක් දෙවියන්වහන්සේට කරන්න.

**මාගේ යාච්ඤාව**

සර්වබලධාරී දෙව්පියාණනි... මම පව් කල බවට පිළිගනිමින් ඔබ ඉදිරියේ වැඳ වැටෙනවා. මම මගේ පාපය උදෙසා මැරෙන්නට සුදුසු නමුත් මගේ පාපය වෙනුවෙන් යේසුස්වහන්සේ කුරුසියට ගිය නිසා ස්තුති කරමි. දැන් මම මගේ පාපයෙන් හැරී මගේ ස්වාමින් හා ගැළවුම්කරුවාණන් ලෙස යේසුස් ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කරමි. යේසුනි මට සමාව දී මගේ හදවත සහ ජීවිතය පිරිසිඳු කල මැනවි. මෙතෙක් මාගේ ජීවිතයේ සාතන්ට පක්ෂපාති වූ හැම කාරණයක් ඔබ වහන්සේගේ අනර්ඝ ලේවලින් සේදුව මැනවි. යේසුනි ඔබ වහන්සේ මගේ ජීවිතය වෙතට පැමිණ ඔබගේ ආත්මයෙන් මා පුරවන ලෙසට ආරාධනා කරමි. මට සමාව දුන් දෙවිඳුනි මම සමාව ලැබීමි. ස්වාමිනි ඔබ වහන්සේ මාව නැවත ඉපදෙව්ව නිසාත් යම් දවසක මම ඔබවහන්සේත් සමඟ ස්වර්ගයේ ජීවත්වන්නට යන බව විශ්වාස කරන නිසාත් ඔබවහන්සේට ස්තුති කරමි. ආමේන්..

ටී.ඩබ්ලිව්.ආර්. ලංකා • තැපැල් පෙට්ටිය අංක 2, පුත්තලම, ශ්‍රී ලංකාව.
දුරකථනය: +94714577634 ©CCIM